# 01

## අලුත් පන්ති නායකයා





"ආයුබෝවන් ගුරුතුමී."

"ආයුබෝවන් දරුවනේ, වාඩිවෙන්න. අපේ අලුත් පන්තිය හරි ලස්සනයි."

"ඔව්, අපි හැමෝ ම මහන්සිවෙලා පන්තිය පිරිසිදු කළා."

"හරි ම හොඳයි."

"නාමලී මල් පෝච්චියක් ගෙනාවා ගුරුතුමී."

"හරි ලස්සනයි. මේස රෙද්ද ගෙනාවේ කවුද?"

"ඒක ගෙනාවේ සඳුනී."

"බොහොම ලස්සන එකක්. කෝ නාම ලේඛනය ගෙනාවා ද?"

"නෑ ගුරුතුමී, තව ම ගෙනාවේ නෑ."

"කවුද ගේන්නේ? තුසිත ඔයා ගිහින් අරගෙන ආවා නම් හොඳයි."

"හොඳයි, ගුරුතුමී."

"අපේ අලුත් පන්තියට නායකයෙක් ඕනෑ නේ ද දරුවනේ?"

"ඔව්, ගුරුතුමී."

"එහෙනම් අපි පන්තියට නායකයෙක් පත් කරමු."

"ආ! තුසිත ආවා නේ ද? වාඩිවෙන්න තුසිත."

"දරුවනේ, කියන්න නායකයෙක් වෙන්න ඕනෑ කොයි වගේ කෙනෙක් ද?"

"හැමෝ ම පිළිගන්නා කෙනෙක් වෙන්න ඕනෑ ගුරුතුමී."

"අවංක ව වැඩ කරන්න ඕනෑ."

"ඉගෙන ගන්න දක්ෂයෙක් වෙන්නත් ඕනෑ."

"ඇයි ගුරුතුමී, පාසලට ආදරය කරන කෙනෙක් වෙන්නත් ඕනෑ නේ ද?"

"ඔව්, ඒ වගේ ම ගුරුතුමන්ලගෙයි ළමයින්ගෙයි සිත් දිනාගත් කෙනෙක් වෙන්නත් ඕනෑ. එහෙම නේ ද දරුවනේ?"

"ඔව් ගුරුතුමී, පාසලේ පොදු වැඩවල දී උදවු කරන කෙනෙක් වෙන්නත් ඕනෑ. කැපවීමෙන් වැඩ කරන්න පුළුවන් ආදර්ශවත් කෙනකු නම් වඩාත් හොඳයි."

"එහෙම නම් ගුරුතුමී, තුසිත තමයි නායකකමට සුදුසු."

"හැමෝ ම කැමති ද තුසිත පන්ති නායකයා වෙනවාට ?."

"ඔව්, ඔව්, අපි කැමතියි. අපි කැමතියි."

"හොඳයි, එහෙම නම්, තුසිත ඔයා තමයි අපේ පන්තියේ අලුත් නායකයා."

"අපි ඔයාට සුබ පතනවා."

"බොහොම ස්තුතියි. මම මට පුළුවන් තරම් හොඳට මගේ වගකීම්, යුතුකම් ඉටුකරන්න මහන්සි ගන්නම්. මට ඔය හැමෝගේ ම සහයෝගය අවශ්‍ය වෙනවා.

ඒ වගේ ම තමයි අපි හැමෝ ම එකා වාගේ ඉන්න ඕනෑ. හැමෝ ම එකිනෙකාට උදවු උපකාර කරන්නත් ඕනෑ."

"ඔව්, ඔව්, අපි උදවු කරන්නම්."

"හොඳයි, එහෙනම් පන්ති නායක තනතුරට පත්කිරීම ගැන මම නැවත වාරයක් හැමෝට ම ස්තුතිවන්ත වෙනවා."

"මමත් ඔයාට සුබ පතනවා තුසිත."

"බොහොම ස්තුතියි ගුරුතුමී."



## ක්‍රියාකාරකම 01



පන්තියේ ශිෂ්‍යයන් දෙදෙනකු බැගින් ඉදිරිපත් වී පාඩමේ සඳහන් සංවාද කොටස් හඬ පාලනයෙන් යුතු ව කියවන්න.
வகுப்பில் இவ்விரண்டு மாணவர் வீதம் முன்வந்து பாடத்தில் உள்ள கலந்துரையாடல் பகுதிகளை உரத்து வாசிக்கவும்.

## ක්‍රියාකාරකම 02

පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු දෙන්න.

பின்வரும் வினாக்களுக்கு விடையளிக்குக.

(i) පන්තියට මල් පෝච්චියක් ගෙනාවේ කවුද?

(ii) නාම ලේඛනය ගෙන ඒමට ගියේ කවුද?

(iii) පන්ති නායකයාගේ නම කුමක්ද?

(iv) පන්ති නායකයකු තුළ තිබිය යුතු ගුණාංග මොනවා ද?

(v) පන්තියට නායකයකු අවශ්‍ය වන්නේ ඇයි?

(vi) පන්ති නායකයා සියලු දෙනාගෙන් ම ඉල්ලා සිටියේ කුමක් ද?

## ක්‍රියාකාරකම 03

මෙම වාක්‍ය කියවන්න.

இவ் வாக்கியங்களை வாசிக்கவும்.

- ♣ අපේ අලුත් පන්තිය ලස්සනයි නේ ද?
- ♣ ඔව්, අපි හැමෝ ම පන්තිය පිරිසිදු කළා.
- ♣ අපි පන්තියට නායකයකු පත් කරමු ද?
- ♣ තුසිත නායකයා වෙනවාට හැමෝ ම කැමති ද ?
- ♣ ඔයා ගිහින් අරගෙන ආවා නම් හොඳයි.
- ♣ අපි හැමෝ ම එකා වාගේ ඉන්න ඕනෑ.

**මෙම වාක්‍යවල තද කළු පාටින් යෙදී ඇති පද නිපාත පද ලෙස හැඳින්වෙයි. ඒවා වාක්‍යයක මුල, මැද හෝ අවසානයේ යෙදෙයි. සිංහල භාෂාවේ යෙදෙන නිපාත වර්ග රාශියක් ඇත.**

වරහන තුළ ඇති නිපාත පද තෝරා සුදුසු පරිදි හිස්තැන්වල යොදන්න.
அடைப்பினுள் உள்ள இணைப்புச் சொற்களில் பொருத்தமானவற்றை தெரிந்து இடைவெளிகளை நிரப்புக.

(i) මල් පෝච්චිය ගෙනාවේ නාමලී ........................?

(ii) සීනුව නාද වූ ............................... පන්තියට යන්න.

(iii) ආදර්ශවත් ................................... හැසිරෙන්න ඕනෑ.

(iv) හැමෝගේ ................................... සහයෝගය අවශ්‍ය වෙනවා.

(v) නාමලී ................................... සඳුනී ............................ මෙහි එන්න.

(vi) ඔබ බසයෙන් ................................. දුම්රියෙන් .............. එන්න.

(පසු, ලෙස, ම, ද, හරි, හෝ)

## ක්‍රියාකාරකම 04

පහත දැක්වෙන නිපාත පද යොදා කෙටි වාක්‍යය බැගින් ලියන්න.
பின்வரும் இணைப்புச் சொற்களைப் பயன்படுத்தி சிறு வாக்கியங்கள் எழுதுக.

(i) නැතහොත්
(ii) වාගේ
(iii) වැනි
(iv) හා
(v) නම්